# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2298/22 - 2022 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා - 2022.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී 9/73 (XII) (B)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය, මහින්ද අමරවීර වන මා විසින් -

1. ඒ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති භූමි ප්‍රදේශය, මේ නියමය පළ කරනු ලබන දින සිට බලපැවැත්වෙන පරිදි "මාදම්පාවිල අභය භූමිය" ලෙස හඳුන්වනු ලබන සහ කියනු ලබන අභය භූමියේ කොටසක් ලෙස පැවතීම අවසන් විය යුතු බවට ; සහ

2. ඒ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ, 2007 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 1515/21 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ විස්තර කර ඇති සහ දළ වශයෙන් හෙක්ටයාර් 1217.75 ක ප්‍රමාණයකින් සමන්විත වන "මාදම්පාවිල අභය භූමිය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශයෙන් මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ප්‍රදේශය බැහැර කිරීමෙන් පසුව ඉතිරිවන භූමි ප්‍රමාණය "මාදම්පාවිල අභය භූමිය" වශයෙන් හඳුන්වනු ලබන බවට සහ කියනු ලබන බවට,

මේ නියමය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**මහින්ද අමරවීර,**
වනජීවී සහ වන සම්පත්
සංරක්ෂණ අමාත්‍ය.

2022 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


*උපලේඛනය*

**"මාදම්පාවිල අභය භූමියෙන්" බැහැර කරන ලද භූමි ප්‍රදේශයේ සීමාවන්**

මෙහි පහත සිතියමේ "ගල් කොරිය" ලෙස සලකුණු කර ඇති සහ කඳවල ශ්‍රී ලංකා බණ්ඩාංක ව්‍යුහයට අනුකූලව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 පරිමාණය මත පදනම්ව පහත සඳහන් GPS බණ්ඩාංක ප්‍රකාරව මායිම් සලකුණු කර ඇති හෙක්ටයාර් 15.5 ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය :-

බණ්ඩාංක නැ 123100 උ113798 වන ආරම්භක ලක්ෂ්‍යය දක්වා සහ එතැන් සිට බණ්ඩාංක නැ 123190 උ 113861 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123316 උ 113847 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123375 උ 113774 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123404 උ 113599 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123355 උ 113434 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123423 උ 113250 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123184 උ 113300 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123074 උ 113491 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123069 උ 113598 දක්වා ද, එතැන් සිට බණ්ඩාංක නැ 123094 උ 113686 දක්වා සහ එතැන් සිට බණ්ඩාංක නැ 123100 උ113798 වන ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

**මාදම්පාවිල අභය භූමියේ සිතියම**




EOG 09 - 0227